පුවත් ශ්‍රැති

ICRC

ශ්‍රී ලංකාව

# සහායක වැඩසටහන: යාපනයේ අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් 350 කට ප්‍රතිලාභ

2022 ඔක්තෝබර්



2015 දී ආරම්භක දිනයේ සිට, ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ සහායක වැඩසටහනින් ශ්‍රී ලංකාවේ “සහායකයන්” සිය ගණනකට සහ  අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් දහස් ගණනකට ආධාර සැපයීම, ඔවුන් අදාළ තැනැත්තන් සමඟ සම්බන්ධ කිරීම හා බලගැන්වීම සිදුකර ඇත. දිස්ත්‍රික්ක 25 පුරා ක්‍රියාත්මක මෙම වැඩසටහනින් අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් වලට  ඔවුන්ගේ ප්‍රියාදරයන් අතුරුදහන්වීම නිසා උද්ගතවූ අවිනිශ්චිතතාවයෙන් පැනනගින චිත්තවේගී අභියෝග මෙන්ම ආර්ථික, නෛතික සහ පරිපාලන අභියෝග සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු ඉටුකර ගැනීමට උපකාර කරයි. උතුරු පළාතේ අතුරුදහන් වූ තැනැත්තන්ගේ මුළු පවුල් 3270 ක් (යාපනය, කිලිනොච්චිය, මන්නාරම, මුලතිව් සහ වව්නියාව යන දිස්ත්‍රික්කවල) පුහුණු සහායකයන් 194 දෙනෙකු මාර්ගයෙන් ආධාර ලබා ඇත.

යාපනයේ එය ආරම්භ කර ගත වූ සත් වසරට පසු යාපනය අර්ධද්වීපයේ සහ ඒ අවට දූපත්වල අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් 350 කට පුහුණු සහායකයන් 22 දෙනෙකු මාර්ගයෙන් ආධාර සපයමින් උතුරු පළාතේ දැන් එම වැඩසටහනේ අවසන් අදියර ක්‍රියාත්මක වෙමින් පවතී. අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් නිරතුරුව උභතෝකෝටිකයකට මුහුණදී සිටිති: ඔව්හු තම ප්‍රියාදරයෝ ජීවත්ව සිටිත්ද සහ යම් දිනක ආපසු තමන් කරා පැමිණෙත්ද යන්න නිරන්තර සිතුවිල්ලෙන් පසුවෙති. ජාත්‍යන්තර රතු කුරුස කමිටුව විසින් පුහුණු කරන ලද සහායකයන්  මෙම පවුල්වලට මෙම අවිනිශ්චිතභාවය මධ්‍යයේ ස්වකීය කටයුතු ඉටුකරගැනීමට උපකාර කරයි. “සහායවීම යනු ‘උපස්ථම්භක මිතුරකු’ වීමය. මෙම පවුල්වලට අන්‍යයන්ට පැවසීමට බොහෝ දේවල් ඇති නමුත්  ඔවුන්ට සවන්දෙන කිසිවෙකු  නොමැති බව මා හොඳින් වටහා ගත්තා”. යාපනයේ සහායිකාවක් පැවසීය.

අන්‍යෝන්‍ය විශ්වාසය සහ සහකම්පනය පදනම් කොට ගොඩනඟන ලද, සහායකයන් සහ අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් අතර බැඳීම  මෙම වැඩසටහන ක්‍රියාත්මක වන කාලය ඉක්මවා නිරතුරුව පවතින අතර එමගින් අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් අතර ඇතිකරන සම්බන්ධතා නිසා ඔවුනොවුන්ට උපකාර කරගැනීමට හැකිවෙයි. “මට උපකාර කරන සහායිකාව මා මුණ ගැසීමට පැමිණීම ගැන මට සතුටුයි.  මට ඇය සමඟ මගේ අතුරුදහන් වූ ප්‍රියාදරයා ගැන කතා කිරීමට පුළුවන්. මා කණස්සල්ලට පත් කරන ප්‍රශ්න එමටයි:  ඇය පැමිණීම නිසා මට සවන්දෙන්න කෙනෙකු සිටින හෙයින් එය මට සැලසෙන සහනයක්,” මේ ලෙස අතුරුදහන් වූ තැනැත්තෙකුගේ ඥාතියෙකු අදහස් පළ කළ කරයි.

## සෞඛ්‍ය අමාත්‍යාංශයට පරිත්‍යාගයක්


SLRCS

ජාත්‍යන්තර රතු කුරුස කමිටුව එහි මානුෂවාදී ප්‍රතිචාරයේ අංගයක් ලෙස, ශ්‍රී ලංකා රතු කුරුස සමාජය සමඟ එක්ව, 2022 ජූලි මාසයේදී ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අමාත්‍යාංශයට වෛද්‍ය උපකරණ සහ සැපයුම් හිඟය ආමන්ත්‍රණය කිරීම පිණිස රුධිරය රැස්කර තැබීමට යොදා ගන්නා බෑග 10,000 ක් පරිත්‍යාග කළේය. මෙම බෑග පරිත්‍යාගය සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය තාක්ෂණ සේවා අධ්‍යක්ෂ සහ සෞඛ්‍ය සහ සත්කාර ආධාරදායක කටයුතු සම්බන්ධීකාරක වෛද්‍ය අන්වර් හම්දානි මහතා වෙත බාරදෙන ලදී.

## රැඳවියන්ගේ සුබසාධනය පිණිස ආධාර


Department of Prisons Sri Lanka

තම නිදහස අහිමි වූ පුද්ගලයින්ගේ කායික සහ මානසික යහපැවැත්ම උදෙසා උචිත සනීපාරක්ෂක මට්ටම් පවත්වා ගැනීමට වගබලාගැනීමේ වැදගත්කම පිළිගනිමින්, ජාත්‍යන්තර රතු කුරුස කමිටුව රට මුණදී ඇති ආර්ථික අර්බුදය මධ්‍යයේ ශ්‍රී ලංකාවේ පිහිටි රැඳවුම් මධ්‍යස්ථාන 25 කට සනීපාරක්ෂක කට්ටල 22,520 ක් සහ පිරිසුදු කාරක ද්‍රව්‍ය බෙදාදුන්නේය.

## පීඩාවෙන් පසුවන පවුල්වලට ධීවර ආම්පන්න


M. Kamil/ICRC

ධීවර පවුල් 326 කට තමන්ගේ ජීවනෝපාය කටයුතු සංවර්ධනය කරගනිමින් ඒවා දියුණුකරගැනීමට ජාත්‍යන්තර රතු කුරුස කමිටුව ධීවර ආම්පන්න ලබාදුන්නේය. මඩකලපුව දිස්ත්‍රික්කයේ වාකරෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උරියන්කාඩ්ඩු ග්‍රාම නිලධාරි වසමේ මෙම උපකරණ ලැබුණු ප්‍රතිලාභීන් අතර අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්, කාන්තාවන් ගෘහමූලිකත්වය දරන පවුල්, ආබාධ සහිත තැනැත්තන් සහ උග්‍ර ලෙස පීඩාවට පත් පවුල් සිටියහ. මෙම උපකරණ බෙදාදීම සිදුකරන ලද්දේ ප්‍රජාමූල සහ හවුල්කාරි සංවිධාන සහ මඩකලපුවේ ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සමඟය.

## වැඩමුළුව: මානුෂීය අර්බුදවලදී මාධ්‍යයේ භූමිකාව



ICRC

ජාත්‍යන්තර රතු කුරුස කමිටුව, ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය සමඟ අගෝස්තු 19 දා “මානුෂීය අර්බුදවලදී මාධ්‍යයේ භූමිකාව” මැයෙන් වැඩමුළුවක් සංවිධානය කළේය. මෙම වැඩමුළුව සැසි තුනකින් සමන්විතවිය: මානුෂීය අර්බුද අවබෝධකරගැනීම සහ මාධ්‍ය, දත්ත පදනම් කරගත් මානුෂීය වාර්තාකරණය සහ විසඳුම් පාදක වාර්තාකරණය. දේශීය ජනමාධ්‍යවේදීන් 20 දෙනෙකු සහභාගි වූ මෙම වැඩමුළුවේ සැසි පවත්වන ලද්දේ ජනමාධ්‍ය සහ මානවහිතවාදය පිළිබඳ විශේෂඥයන් විසිනි. මෙම වැඩමුළුව පවත්වන ලද්දේ ජාත්‍යන්තර රතු කුරුස කමිටුව “යුද වාර්තාකරණයේ සදාචාරාත්මක අභියෝග” මැයෙන් සංවිධානය කළ 2022 අතථ්‍ය මාධ්‍ය සමුළුවට සමගාමීවය.

# තොරතුරු සහ දත්ත
## (2022 මැයි - අගෝස්තු)

## අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වල අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම

- අතුරුදහන් වූ තැනැත්තන් සොයාගැනීම සම්බන්ධයෙන් කරතිබූ විමසීම් පිළිබඳ පසුවිපරම් කිරීමට පවුල් 227 ක් හමුවූ අතර අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ සිද්ධි 9 ක් ලියාපදිංචි කරන ලදී
- අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතීන් 705 දෙනෙකු වෙනුවෙන් අපගේ හවුල්කාර සංවිධාන මාර්ගයෙන් සතිපතා මනෝසමාජීය ආධාර සැසි (තනි පුද්ගල සහ කණ්ඩායම් වශයෙන්) 1841 ක් පවත්වන ලදී. ඔවුන්ගෙන් 151 දෙනෙකු ආර්ථික, නෛතික/පරිපාලන, අධ්‍යාපන සහ සෞඛ්‍ය අවශ්‍යතා සඳහා ආධාර ලබාගැනීම පිණිස අවශ්‍ය සම්පත් ස්ථාන කරා යොමු කරන ලදී
- අතුරුදහන් වූ තැනැත්තන්ගේ පීඩාවට පත් පවුල් 1,028 කට දෙසතියක කාලයකට සරිලන ඔවුන්ගේ දෛනික ආහාර සහ පෝෂණ අවශ්‍යතා සපුරා ගැනීමට සහ ඔවුන්ගේ සනීපාරක්ෂක තත්වයන් රැකගැනීමට හෝ නැවත සකස්කරගැනීමට බහුකාර්ය මුදල් ආධාර (එක් පවුලකට ශ්‍රී ලංකා රුපියල් 18,000 බැගින්) ලබා දෙන ලදී
- අසරණව සිටින අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් 65 කට ඔවුන්ගේ හදිසි අවශ්‍යතා සපුරාගැනීම සඳහා (ආහාර සහ වෙනත් අත්‍යවශ්‍ය වියදම්) අතිරේක බහුකාර්ය මුදල් ප්‍රදාන සපයා දෙන ලදී
- ප්‍රජාමූල ජීවනෝපාය ආධාර වැඩසටහන මාර්ගයෙන් පවුල් 210 කට ජීවනෝපාය කටයුතු නැවත ආරම්භකිරීමට සහ දියුණුකර ගැනීමට ධීවර ආම්පන්න සපයා දෙන ලදී
- රජයේ පශු සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවල සම්බන්ධීකරණය යටතේ ප්‍රජාමූල ජීවනෝපාය ආධාර වැඩසටහනට සම්බන්ධ 227 දෙනෙකුට ව්‍යාපාර කළමනාකරණ කුසලතා පුහුණුව ලබා දෙන ලදී

### අධිකරණ වෛද්‍ය ධාරිතාවය ශක්තිමත් කිරීම

- ඇටසැකිළි පරීක්ෂාවන් ප්‍රගුණකිරීමට අධිකරණ වෛද්‍යවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි අභ්‍යාසලාභීන් 39 දෙනෙකු සඳහා අධිකරණ වෛද්‍ය මානවවිද්‍යා කාර්ය සංග්‍රහය කෙටුම්පත පිළිබඳ වැඩමුළුවක් පැවැත්වීමට ශ්‍රී ලංකා අධිකරණ වෛද්‍ය විද්‍යාඥයන්ගේ විද්‍යාලය ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ ආධාර ඇතිව පහසුකම් සැලසීය. ඊට අතිරේකව, නම්කරන ලද වෛද්‍ය ආයතන වෙත නිරවද්‍ය උපකරණ සහ යොමු ද්‍රව්‍ය පරිත්‍යාග කරන ලදී
- විශ්ව විද්‍යාල 5 ක අධිකරණ වෛද්‍යවිද්‍යා අංශ වෙත පුද්ගල ආරක්ෂණ උපකරණ සහ විෂබීජ නාශක ද්‍රව්‍ය පරිත්‍යාග කරන ලදී

## රැඳවුම් තත්වයන් නිරීක්ෂණය කිරීම

- රැඳවුම් ස්ථාන 12 ක චාරිකා 14 ක් කරන ලද අතර සොයාගත් කරුණු සහ නිර්දේශ බන්ධනාගාර බලධාරීන් සමඟ රහස්‍ය අන්දමින් හුවමාරුකර ගන්නා ලදී
- රටේ විවිධ ස්ථානවලදී රැඳවියන් 179 දෙනෙකු වෙන් වෙන්ව හමුවන ලදී
- රැඳවුම්භාරයේ පසුවන තම ඥාතීන් හමුවීමට යාම සඳහා පවුල් 220 කට ගමන් වියදම් ලබා දෙන ලදී
- රැඳවියන් 15,478 දෙනෙකුට සනීපාරක්ෂක ද්‍රව්‍ය සහ අධ්‍යාපනික හා විනෝදාත්මක ද්‍රව්‍ය වශයෙන් තත්කාර්ය ආධාර සපයන ලදී
- බන්ධනාගාර සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර නිර්දේශ සහ දේශීය නීති රාමුව පිළිබඳ මාර්ගෝපදේශ සැකසීම අවසන් කරන ලදී
- බන්ධනාගාර රෝහල් 5 කට (දුම්බර, කළුතර, මහර, මීගමුව සහ වැලිකඩ) මූලික වෛද්‍ය උපකරණ සපයන ලදී
- ස්විට්සර්ලන්තයේ ජිනීවාහි පැවති බන්ධනාගාරවල සෞඛ්‍ය සේවා පිළිබඳ ප්‍රථම ලෝක සමුළුවට සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් සහ බන්ධනාගාර දෙපාර්තමේන්තුවෙන් නියෝජිතයන් 4 දෙනෙකු සහභාගි වුහ
- බන්ධනාගාර 5 කට ගර්භණී හෝ කිරිදෙන කාන්තාවන් සහ ළමයින් උදෙසා කිරි ලබා දෙන ලදී
- දැඩි අවදානම් සත්කාර කාර්යයන්හි නිරතවීමේදී භාවිතය පිණිස කෝවිඩ්-19 නිවාරණ ක්‍රියාමාර්ගවලට ආධාර කිරීමක් වශයෙන් කෑගල්ල බන්ධනාගාර රෝහලට මුහුණු ආවරණ 100 ක් පරිත්‍යාග කරන ලදී
- මහර බන්ධනාගාර රෝහලට මේස 4 ක්, පුටු 13 ක් සහ වානේ කබඩ් 2 ක් පරිත්‍යාග කරන ලදී
- වැලිකඩ බන්ධනාගාර රෝහලට ඊසීජී යන්ත්‍රයක් සහ මුද්‍රකයක් පරිත්‍යාග කරන ලදී



## ජාත්‍යන්තර මානුෂවාදී නීතිය ප්‍රවර්ධනය කිරීම

- දකුණු සුඩානයේ එක්සත් ජාතීන්ගේ දූත මෙහෙය ඉටුකිරීම සඳහා පිටත්ව යන යුද හමුදාවේ 93 දෙනෙකු සහ මධ්‍යම අප්‍රිකානු ජනරජයේ එක්සත් ජාතීන් ගේ බහුමාන ඒකාබද්ධ ස්ථායිකරණ දූත මෙහෙය ඉටුකිරීම සඳහා සම්බන්ධවීමට පිටත්ව යන ගුවන් හමුදාවේ 166 දෙනෙකු (ගුවන්සේවා බලඇණිය) වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙය පිළිබඳ විස්තරකිරීම් දෙකක් පවත්වන ලදී
- ක්වාලාලම්පූර්හි යුද්ධ සහ ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳ මධ්‍යස්ථානය විසින් ජූලි 19 දා සිට 21 දා දක්වා මෙහෙයුම් සහ යුද හමුදා නීති නිලධාරීන් වෙනුවෙන් පවත්වන ලද තෙදින මාර්ගගත මෙහෙයුම් නීති පාඨමාලාවට ත්‍රිවිධ හමුදාවේ නිලධාරීහු 6 දෙනෙක් (නීති 1 සහ මෙහෙයුම් 1 බැගින්) සහභාගි විය
- ජාතික පොලිස් ඇකඩමියේදී පොලිස් සේවය සහ මහජන සාමය කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිති මැයෙන් පවත්වන ලද අතථ්‍ය පුහුණු සැසිවාර දෙකකට ස්වකීය රැකියා යාවත්කාලීන කරන අංගයක් වශයෙන් ප්‍රධාන පොලිස් පරීක්ෂකවරු 108 දෙනෙක් සහභාගි වූහ
- ජාත්‍යන්තර රීති සහ පොලිස් සේවා සඳහා ප්‍රමිති පිළිබඳව අගෝස්තු මාසයේදී පවත්වන ලද එක්දින පුහුණු වැඩසටහනින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ ත්‍රස්ත මර්දන විමර්ශන කොට්ඨාසයේ විමර්ශන නිලධාරීන් 49 දෙනෙකුට ප්‍රතිලාභ අත්විය
- පොලිස් සේවා සඳහා ජාත්‍යන්තර ප්‍රමිති පිළිබඳව අගෝස්තු මාසයේදී ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේදී පවත්වන ලද එක්දින පුහුණු වැඩසටහනින් අලුතින් බඳවා ගත් උප පොලිස් පරීක්ෂකවරුන් 230 දෙනෙකුට ප්‍රතිලාභ අත්විය



## ශ්‍රී ලංකා රතු කුරුස සමාජයට ආධාර ලබාදීම

- ආර්ථික අර්බුදයෙන් පැනනගින මානුෂවාදී අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම පිණිස සෞඛ්‍ය අමාත්‍යාංශයට රුධිරය රැස්කර තැබීමට යොදා ගන්නා බෑග 10,000 ක් පරිත්‍යාග කරන ලදී
- ශාඛා ආපදා ප්‍රතිචාර ශිල්පක්‍රම සහ කඳවුරු කළමනාකරණය සම්බන්ධයෙන් ස්වේච්ඡා සේවකයන් 113 දෙනෙකු සඳහා පුහුණුව ලබා දෙන ලදී
- මානුෂවාදී ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර රතු කුරුස සහ රතු අඩසඳ සංවිධානය පිළිබඳ දැනුවත් කිරීමේ සැසි 24 ක් පවත්වන ලදී
- දිස්ත්‍රික්ක මට්ටමේ උත්සවවලදී ප්‍රථමාධාර සේවා 7 ක් පවත්වන ලදී
- ප්‍රථමාධාර ශිල්ප ක්‍රම පිළිබඳව දැනුම යාවත්කිරීමේ පාඨමාලාවකට ස්වේච්ඡා ප්‍රථමාධාර උපදේශකවරු 47 දෙනෙක් සහභාගි වූහ

**ජාත්‍යන්තර රතු කුරුස කමිටුව**
29, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 05
ශ්‍රී ලංකාව
දුරකථන: +94 (11) 250 33 46
ෆැක්ස්: +94 (11) 250 33 48
ඊ මේල් : colombo@icrc.org
වෙබ්: www.icrc.org

**මඩකලපුව කාර්යාලය**
මන්රීසා පාර
පිල්ලයාරඩි මඩකලපුව
දුරකථන: +94 (0)65 222 70 70

**වව්නියාව කාර්යාලය**
70, වයිරවර් කෝවිල පාර,
වයිරවර්පුලියන්කුලම්, වව්නියාව
දුරකථන: +94 (0)24 222 28 55
ෆැක්ස්: +94 (0)24 222 25 37

facebook.com/icrc
twitter.com/icrc
instagram.com/icrc

ICRC

කවරයේ ඡායාරූපය: ඩී.රාජේන්ද්‍රන්/ICRC
© ICRC,ඔක්තෝම්බර් 2022

1967/259 10.2022